www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාව: ජවිපෙ සහ විධායක ජනාධිපති ක්‍රමය

## Sri Lanka: The JVP and the executive presidency

කේ. රත්නායක විසිනි
2009 ඔක්තෝබර් 10

ශ්‍රී ලාංකික විරුද්ධ පක්ෂයක් වන ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ), රටේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම, අද දින පැවැත්වෙන දකුනු පලාත් සභා මැතිවරනය ඇතුලු, සිය නා නා ප්‍රකාර උද්සෝෂනවල ප්‍රධාන දේශපාලන සටන් පාඨය බවට මෑතක සිට පත් කර ගෙන ඇත. කිසිවෙකු ජවිපෙ වාචාලයන් විශ්වාස කරන්නේ නම්, ඔන්න දැන් ඉතින් ඒ පක්ෂය ජනාධිපති මහින්ද රාජපක්ෂගේ ඒකාධිපතිවාදී විධික්‍රමවලට විරුද්ධව ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් රැකගැනීමට සටන් වදින වීරයෙකු බවට පත්ව සිටින්නේ ය.

1978 දී දක්ෂිනාංශික එක්සත් ජාතික පක්ෂය (එජාප) සිදු කල ව්‍යවස්ථාමය වෙනස්කම්වල කොටසක් හැටියට ඇති කෙරුනු විධායක ජනාධිපති ක්‍රමය රාජ්‍යයේ හා ආන්ඩුවේ ප්‍රධානියාට අසීමිත බලතල ලබා දෙන්නකි. රාජපක්ෂගේ අත, මෙම තානාන්තරය, ව්‍යවස්ථාවට ද නෛතික පද්ධතියට ද පාර්ලිමේන්තුවට ද පිලිකුල් සහගතව සලකන දේශපාලක-මිලිටරි කල්ලියක කේන්ද්‍රස්ථානය බවට පත්ව ඇත. රාජපක්ෂ ජනාධිපති පමනක් නො වේ; ආරක්ෂක ඇමති සහ මුදල් ඇමති ද වේ. ආන්ඩුවේ තීරන ගැනීමේ ක්‍රියාවලියේ සැබෑ කේන්ද්‍රය වී ඇත්තේ කැබිනට් මන්ඩලය නො ව ජනාධිපති ලේකම් කාර්යාලය යි.

ඒ කොයි හැටි වෙතත්, ජවිපෙ උද්සෝෂනය වූකලි නරුම සහගත කුටෝපායකි. එක් අතකින් එහි ඉලක්කය වන්නේ ගම්බද ජනයා අතර එම පක්ෂයට පැවති සහාය වියැකී යන තතු යටතේ රුකුල් දී එය යලි නංවා ගැනීම යි. අනෙක් අතින්, රාජපක්ෂ තන්ත්‍රය කල සාපරාධී ක්‍රියාවලට තමන් පිදූ පාපී සහාය වසං කර ගැනීම යි. මේ අතර මුල් තැනට පත් වන්නේ දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට එරෙහිව රාජපක්ෂ යලි ඇරඹූ වාර්ගික යුද්ධයටත් එහි කොටසක් හැටියට හමුදාව සාමාන්‍ය දෙමල වැසියන් මත වග විභාගයක් නැතිව කල බෝම්බ හෙලීම්වලට සහ ආන්ඩුවට හිතපක්ෂපාතී ඝාතක කල්ලි කල "අතුරුදන් කිරීම්" සහ ඝාතනවලටත් ඔවුන් පිදූ සහාය යි. එමෙන් ම, මැයි මාසයේ දී එල්ටීටීඊය පරාජයට පත් වූ පසුව සාමාන්‍ය දෙමල වැසියන් 250,000කට අධික සංඛ්‍යාවක් දැවැන්ත රැඳවුම් කඳවුරුවල ගාල් කරන්නට ආන්ඩුව ගත් පියවරට ද ජවිපෙ සහාය දෙයි.

අගෝස්තුවේ දී ජවිපෙ හදිසියෙන් ම විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමට බල කරමින් නිවේදන නිකුත් කරන්නට යෙදුනේ, අප්‍රේල් මාසයේ දී පැවැත්වීමට නියමිත පාර්ලිමේන්තු මහ මැතිවරනයට කලින් එන අවුරුද්දේ මුල දී ඊලඟ ජනාධිපතිවරනය පැවැත්වීමේ සැලසුම් ගැන රාජපක්ෂ සහ ආන්ඩුවේ නායකයන් ඇඟවුම් කිරීමත් සමග ය. ජනාධිපති ඡන්දය පවත්වන්නට නියමිතව ඇත්තේ 2011 අවුරුද්දේ දී වුවත් ශ්‍රී ලංකාව තුළ ද ජාත්‍යන්තරව ද ආර්ථික අර්බුදය වඩා නරක අතට හැරෙද්දී තමන්ට පවතින සහාය තව දුරටත් නිසැකව ම වියැකී යනු ඇතැයි රාජපක්ෂ පැහැදිලිව ගනන් බලයි. මිලිටරි ජයග්‍රහනය "සාමයේ සහ සමෘද්ධියේ" නව යුගයක් ආරම්භ කරන බවට ඔහු දෙසූ මුසාවල දැනට මත් පල්ල ගොස් හමාර ය.

ජනාධිපතිවරනය ජවිපෙ අබිමුව උභතෝකෝටිකයක් මතු කරයි. 2005 දී, තමන්ගේ ම අපේක්ෂකයෙකු ඉදිරිපත් නොකරන්නට එය තීන්දු කලේ ය. මුල් වතාවට පෙර අවුරුද්දේ දී ඇමතිකම් භාර ගැනීමෙන් පසුව, ගම්බද සිංහල ජනයා ඇතුලු මහජනයා අතර තමන්ට පැවති සහාය වේගයෙන් බිඳ වැටෙමින් තිබෙන බව ජවිපෙ තේරුම් ගත්තේ ය. ජවිපෙ තමන්ගේ ජීවන තත්වයන් වැඩි දියුනු කර දෙතැයි ගම්බද සිංහල ජනයා බලාපොරොත්තුව සිටියේය. ඉදින්, සිය ඡන්ද කඩාවැටීම එලිදරව් වෙතැයි බිය වී තමන්ගේ ම ජනාධිපති අපේක්ෂකයෙකු ඉදිරිපත් නොකරන්නට තීන්දු කල ජවිපෙ ඒ වෙනුවට රාජපක්ෂගේ මැතිවරන උද්සෝෂනයට සහාය දෙනු පිනිස ඔහු සමග අවබෝධතා ලියවිල්ලකට අත්සන් තැබී ය.

සිවු වසරකට පසුව, ජවිපෙ මුහුන දෙන දුෂ්කරතා කිහිප ගුනයකින් වර්ධනය වී ඇතුවා පමනකි. පක්ෂය පාලක සන්ධානයට එකතු නො වී විරුද්ධ පක්ෂයේ රැඳී සිටින්නේ, බොහෝ දුරට ම ආන්ඩුව එන්න එන්න ම සිය ජනප්‍රිය භාවය අහිමි කර ගනිමින් සිටින නිසා ය. කොහොම නමුත් ඒ අතරේ ම, 2006 දී රාජපක්ෂ රට ආපසු යුද්ධයෙහි ගිල්ලද්දී ජවිපෙ ඔහුට මුලුමනින්

ම සහාය දුන්නේ ය. එමෙන් ම, වැඩ කරන ජනයා මත අලුත් බරබද්දල් පැටවූ ඔහුගේ යුද අයවැයවලට සහ දුෂ්ට හදිසි නීති බලතලවලටත් එය ඡන්දය දුන්නේ ය. පක්ෂයේ ජනප්‍රිය භාවය එන්න එන්න ම පිරිහෙද්දී ජවිපෙ පාර්ලිමේන්තු කන්ඩායමේ නායකයාව සිටි විමල් වීරවංශගේ නායකත්වය යටතේ ඉන් කැඩී ගිය කන්ඩායමක් ගිය අවුරුද්දේ අප්‍රේල්වල දී ආන්ඩුවට එක්විය.

මේ අවුරුද්දේ පැවැත්වුනු පලාත් සභා මැතිවරනවල මෑත ම වටයේ දී ජවිපෙ ඡන්ද ප්‍රමානය කඩාවැටුනි. එහි පලාත් සභා ආසන ගනන, මධ්‍යම පලාතේ දී 12 සිට බිංදුව දක්වා ද වයඹ පලාතේ දී 6 සිට 1 දක්වා ද බස්නාහිර පලාතේ දී 23 සිට 3 දක්වා ද පහත වැටින. අද දින පැවැත්වෙන දකුනු පලාත් සභා මැතිවරනයේ ප්‍රතිඵලය ද මීට සමාන වීමට ඉඩ ඇත.

ඊලඟ අවුරුද්දේ දී තමන්ගේ ම ජනාධිපති අපේක්ෂකයෙකු ඉදිරිපත් කිරීමට ජවිපෙ තීරනය කලොත් ඔවුන්ගේ මහජන සහයෝගය වියැකී ගොස් ඇති බව වඩාත් කලඑලියට එනු ඇත. මේ නිසා ඔවුන්ට ඉතිරි වී ඇත්තේ අමිහිරි විකල්ප දෙකකි: එනම් එක්කෝ 2005 දී කලා සේ රාජපක්ෂට උදව් කිරීම යි, නැත් නම් දක්ෂිනාංශික එජාප අපේක්ෂකයාට රුකුල් දීම යි. මේ අනුව, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්නට ජවිපෙ කරන කැඳවිල්ලෙහි ගැබ් වන්නේ දේශපාලන උපාමාරුවකි - එනම් රාජපක්ෂට එරෙහිව උද්ඝෝෂනය කරන බවට තර්ජනයකි; එමෙන් ම ජනාධිපති ඡන්දය කල් දමන්නට කරන කන්නලව්වක් සහ තම තමන් අතර සන්ධානය යලි අලුත් කර ගත හැකි බවට ඉඟියකි. වැඩ කරන ජනයාගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සමග ඊට කිසිදු සම්බන්ධයක් නැත.

අගෝස්තු මාසයේ දී රාජපක්ෂට ලිපියක් යවමින් තමන්ගේ "උද්ඝෝෂනය" දියත් කල ජවිපෙ එතැන් පටන් එම ලිපිය තමන්ගේ ප්‍රසිද්ධ රැස්වීම්වල දී ද සම්මන්ත්‍රනවල දී ද බෙදා හැර ඇත. ජවිපෙ ලේකම් ටිල්වින් සිල්වා ලියූ ඒ ලිපිය කලින් මැතිවරනයක් පැවැත්වීමේ සැලසුම ගැනත් 2005 දී ජවිපෙ සමග එකඟ වූ පරිදි විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්නට රාජපක්ෂ අසමත් වීම ගැනත් වැලපෙයි. "ඔබට ලැබුනු ජනවරම ගැන කිසි ම තැකීමක් නැතිව, රට වෙනුවෙන් ජවිපෙ සමග අත්සන් කල අවබෝධතා ගිවිසුම පසෙකට දැමීම සදාචාරාත්මක නොවන ක්‍රියාවකි" යි ප්‍රකාශ කරන ඔහු, "තවත් ජනාධිපතිවරනයක් පැවැත්වීමේ අදහස අත හැර දමා පොරොන්දු වූ පරිදි විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමට පියවර ගන්නැ"යි රාජපක්ෂට කනිපින්දම් කියයි.

මැතිවරන කටයුතු පිලිබඳ එකඟතාවක් වූ අවබෝධතා ගිවිසුම ජාතිය සමග ඇති කර ගත් පූජනීය ගිවිසුමක් හැටියට නිරූපනය කිරීමට ජවිපෙ දරන්නා වූ ප්‍රයත්නය විකාරයකි. රාජපක්ෂ ලබා ගත් පටු ජයග්‍රහනය අත් කර ගන්නට ජවිපෙ ඔහුට උදව් කලේ ඔහුගේ "මහින්ද චින්තන" වැඩ පිලිවෙල දරිද්‍රතාව සහ විරැකියාව විසඳීමේ ද ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ සහ සාමය ප්‍රවර්ධනය කිරීමේ ද උපායක් ලෙස ඔප වඩමිනි. තානාන්තරයේ වැඩ භාර ගත් වහා ම තමන් දුන් පොරොන්දු පසෙක ලෑ රාජපක්ෂ, මුල පටන් ම අවබෝධතා ගිවිසුමේ කේන්ද්‍රීය පදනම වී තිබූ එල්ටීටීඊයට එරෙහි යුද්ධය යලි පටන් ගැනීම සඳහා කඩිනම් පියවර ගත්තේ ය.

දැන් එය ඊලඟ අවුරුද්දේ මැතිවරනවලට ලක ලෑස්ති වෙද්දී, ජවිපෙ ආපසු වතාවක් ඡන්ද දායකයන් මුලා කරන්නට වෑයම් කිරීමේ ඉලක්කය ඇතිව විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමේ ඉල්ලීමට යලි පන දී ඇත. ඔවුන් දකුනු පලාත් සභා මැතිවරන උද්ඝෝෂනයේ දී බෙදූ පත්‍රිකාවලින් ප්‍රකාශ වූයේ ජවිපෙ යනු "ප්‍රජාතන්ත්‍ර විරෝධී පාලනයට" විකල්පයක් ද

"යහපාලනය" ලඟා කර ගැනීමේ මාධ්‍යයක් ද බව ය. ඒ කොහොම නමුත්, ජවිපෙ වාර්තාව පෙන්නුම් කරන හැටියට නම් එහි විරුද්ධත්වය මූලධර්ම පදනම් කර ගැනෙන්නක් නො ව දේශපාලනික උපයෝගිතාව පදනම් කර ගත්තක් වනු ඇත.

1960 දී ජවිපෙ ගොඩ නැගුවේ මාඕවාදය, කස්ත්‍රෝවාදය සහ සිංහල ජනතාවාදය පදනම් කර ගත් ගරිල්ලා සංවිධානයක් හැටියට ය. 1983 දී එල්ටීටීඊයට එරෙහි සිවිල් යුද්ධය පුපුරා යාමෙන් අනතුරුව, ජවිපෙ වේගයෙන් දකුනට ගමන් කලේ ය. එය ඉන්දියානු සාම සාධක හමුදාවක් පටවා ගැටුම අවසන් කරන්නට ප්‍රයත්න දැරූ 1987 ඉන්දු-ලංකා ගිවිසුම ජාතිය පාවා දීමක් යැයි හෙලා දැක්කේ ය. 1980 ගනන්වල අග දී ජවිපෙ ෆැසිස්ට්වාදී සන්නද්ධ මැරයෝ එහි දේශප්‍රේමී උද්ඝෝෂනයට එක් වීම ප්‍රතික්ෂේප කල කම්කරුවන් ද වෘත්තීය සාංගමිකයන් ද දේශපාලනික විරුද්ධවාදීන් ද සිය ගනනක් ඝාතනය කර දැමූහ.

හැම විට ම ජවිපෙ ප්‍රධාන සාමාජීය පදනම වූයේ ගම්බද දුගී සිංහල තරුන පෙල අතර ය; විශේෂයෙන් ම දිවයිනේ දකුනෙහි සිංහල තරුනයන් අතර ය. 1994 දී ප්‍රධාන දේශපාලන ප්‍රවාහයට එක් වීමෙන් පසුව, එජාපය සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රීලනිප) යන ප්‍රධාන ධනේශ්වර පක්ෂ ගැන අතෘප්තිය වැඩී එද්දී පක්ෂය වැඩදායී ආරක්ෂක කපාටයක් ලෙස ක්‍රියාත්මක විය. ශ්‍රීලනිප අපේක්ෂිකා චන්ද්‍රිකා කුමාරතුංග විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන බවට පොරොන්දු වූ පසුව ඇයට අනුග්‍රහ දැක්වීමක් හැටියට ජවිපෙ 1994 ජනාධිපති තරගයෙන් ඉවත් විය. එහෙත් ඇ ඉක්මනින් ම එම පොරොන්දුව පසෙක ලෑවා ය. අවුරුදු හයකට

පසුව 2001 දීත් ඇ යලිත් එම ප්‍රතිඥාව ම ජවිපෙට දුන්නා ය. ඒ පාර්ලිමේන්තුවේ බහුතරය පවත්වා ගන්නට ඇය දැරූ අසාර්ථක ප්‍රයත්නයක දී ය.

පාර්ලිමේන්තුවේ පාලනය අත් කර ගත් එජාපය 2002 දී එල්ටීටීඊය සමග සටන් විරාමයකට අත්සන් තැබී ය. එය ආන්ඩුවත් ජනාධිපති ධුරයත් අතර පොරයක් නිර්මානය කලේ ය. එවිටත් ජනාධිපති තනතුර දැරුවේ කුමාරතුංග ය. විධායක ජනාධිපති ක්‍රමය අවසන් කිරීමට කැඳවුම් කිරීම වෙනුවට, සටන් විරාමයට විරුද්ධත්වය පෑ ජවිපෙ කලේ, එජාප ආන්ඩුව පෙරලා දැමීමටත් නව මැතිවරනයක් පැවැත්වීමටත් තමන් සතුව තිබෙන ප්‍රජාතන්ත්‍ර විරෝධී බලතල යොදා ගන්නා ලෙස කුමාරතුංගගෙන් ඉල්ලා සිටින උද්ඝෝෂනයක් ආරම්භ කිරීම යි. ජාතික ආරක්ෂාවට හානි කරන්නේ යැයි කියමින් 2003 නොවැම්බර් මාසයේ දී ආන්ඩුවේ ප්‍රධාන ඇමතිවරුන් තිදෙනෙකු තනතුරුවලින් පහ කල විටත් අනතුරුව 2004 පෙබරවාරි මාසයේ දී මුලු ආන්ඩුව ම පන්නා හැරි විටත් ජවිපෙ කුමාරතුංගට හුරේ දැමී ය.

එවේලෙහි ජවිපෙ ලේකම් ටිල්වින් සිල්වා ඡන්දයෙන් තේරී පත් වූ ආන්ඩුව බලයෙන් පහ කිරීම යුක්ති සහගත කෙරුවේ එල්ටීටීඊය සමග මොන යම් හෝ සාම ගනුදෙනුවකට තමන්ට ඇති විරුද්ධත්වය යලි ප්‍රකාශ කරමිනි. "මේක ශ්‍රී ලංකාවට තීරනාත්මක කාල පරිච්ඡේදයක්" යැයි ඔහු කියා සිටියේ ය. "මේක ආගම ගැන, කුලය ගැන හෝ දර්ශනය ගැන සලකන්න පුලුවන් කාලයක් නෙවි, මේක බෙදුම්වාදය [එල්ටීටීඊය] පරාජය කරන්නත් හැම ප්‍රජාවකට ම මහජන හිතවාදී වන දේශපාලන වාතාවරනයක් ඇති කරන්නත් ජනාධිපතිතුමියට සහාය වෙන්න ඕන කාලයක්. ඒක කරන්න නං ප්‍රජාතන්ත්‍ර විරෝධී බලවේග පරාජය කරන්න අපි සූදානම් වෙන්න ඕන."

ආන්ඩුව බලයෙන් පහ කිරීමට ඔන්න මෙන්න තියා ජවිපෙ කුමාරතුංග සමග ගිවිසුමකට අස්සන් තැබුවේ ය. ඒ 2004 අප්‍රේල් මාසයේ දී පැවැත්වෙන මහ මැතිවරනයේ දී ඒකාබද්ධව උද්ඝෝෂනයේ යෙදෙන්නට ද කෘෂිකර්ම, සුලු කර්මාන්ත සහ ධීවර ඇමතිකම් ජවිපෙට හිමි වන සන්ධාන ආන්ඩුවක් ගොඩ නගන්නට ද මග හදා ගනිමිනි. ඔවුන් තානාන්තර දැරූ කාලය වසරකට පමනක් සීමා විය. එහෙත් එය සන්ධිස්ථානයක් බව ඔප්පු වන්නට නියමිතව තිබින. ජවිපෙ ඇමතිවරු ආන්ඩුවේ වෙලඳ පොල හිතවාදී න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කරද්දී, ග්‍රාමීය ආර්ථිකය දිගින් දිගට ම පිරිහෙද්දී, ජවිපෙ ප්‍රධාන පක්ෂ දෙකට විකල්පයක් යැයි කලින් සලකා ගෙන සිටි ධීවරයෝ ද ගොවියෝ ද සුලු ව්‍යාපාරිකයෝ ද කලකිරීමට පත් වූහ.

ජවිපෙට පැවති සහාය කිසි විටෙකත් යලි ප්‍රකෘති තත්ත්වයට පත් වී නැත. විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්නැයි එය කරන කැඳවිල්ල වූකලි මංමුලා සහගත ප්‍රයත්නයකි. එහි ඉලක්කය වන්නේ, රාජපක්ෂට සහ ඔහුගේ යුද්ධයට තමන් පුදන සහායෙන් ද විශේෂයෙන් ම දෙමල ජනයාට එරෙහි රාජ්‍ය මර්දනයට තමන් දෙන අනුබලයෙන් ද එමෙන් ම වැඩ කරන ජනයාගෙන් බහුතරය මුහුන දී සිටින ගැඹුරු වන සාමාජීය සහ ආර්ථික අර්බුදයට ආමන්ත්‍රනය කිරීම සඳහා තමන්ට කිසි ම ප්‍රතිපත්තියක් නැතිකමෙන් ද අවධානය ඉවතට යොමු කිරීම යි.

© www.wsws.org